# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2064/28 - 2018 මාර්තු මස 28 වැනි බදාදා - 2018.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය*: MTR/LND/ACQUI/LI/3978.
*ඉ.අ. යොමු අංකය*: 4-3/11/2015/NRD/217.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1994 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 430ඒ තල්පාවිල උතුර ග්‍රාම නිලධාරී වසමේ තල්පාවිල නැගෙනහිර ගමේ පිහිටි මු.පි. මාර 2725 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන මතු සඳහන් ඉඩම මාතර කතරගම නව දුම්රිය මාර්ගය ඉදිකිරීම නිසා නිවාස අවදානම් තත්වයට පත්වීම සහ එම ස්ථානයේ පවතින තාක්ෂණික අවශ්‍යතාවය මත නිවාස අත්කර ගැනීම සඳහා අත්කරගනු ලැබේ.

**උපලේඛනය**

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: හිල්ක්‍රෙස්ට් වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත ස්ථිර ගොඩනැගිල්ලක්, වැසිකිළියක් සහ ළිඳක් ඇත; ඉඩමේ හිමිකම් කියන්නා: ප්‍රියන්ති ගුණවීර, යස ඉසුරු, තල්පාවිල උතුර, කැකණදුර; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0479.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 අප්‍රේල් මස 27 වන දින පෙ.ව. 10.30 ට මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය. තවද 2018 අප්‍රේල් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩී. ඩී. කේ. වික්‍රමආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2018 මාර්තු මස 23 වැනි දින,
මාතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

04 - 481

මෙම *අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.
1A - G 27376 - 17 (2018/03)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.